**කොළඹ විශ්වවිද්‍යාලයට අනුයුක්ත මානව සම්පත් අභිවර්ධන ආයතනය 2010**

-----------------------------------------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

---------------

1.1 **මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, කොළඹ විශ්වවිද්‍යාලයට අනුයුක්ත මානව සම්පත් අභිවර්ධන ආයතනය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ජේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනයුක්ත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---------------------------------------

1.2.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

------------------------------

විගණනය සඳහා 2011 මාර්තු 01 දින ඉදිරිපත් කරන ලද මූල්‍ය පකාශන වල පැවති ගිණුම්කරණ දෝෂ ඇතුළත් විගණන විමසුමක් 2011 අප්‍රේල් 19 දින අධ්‍යක්ෂකවරයා වෙත යවන ලද අතර ඒ අනුව සංශෝධිත මූල්‍ය ප්‍රකාශ 2011 මැයි 05 දින විගණනය වෙත ඉදිරිපත් කරන ලදි.

1.2.2 **ගිණුම්කරණ අඩුපාඩු**

---------------------

1.2.3 **හඳුනා නොගත් ශේෂ**

----------------------

2010 දෙසැම්බර් 31 දින වන විට දිගින් දිගටම පැවතී එන අත්තිකාරම් ගිණුම් 3 ක රු.200,166 ක් වූ ශේෂ හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.4 අය නොවී පවතින ශේෂ

-------------------------

2010 දෙසැම්බර් 31 දිනට ගිණුම් 3 ක රු.257,853 ක ශේෂ වසර 02 සිට වසර 04 ක කාලයක් දක්වා අය නොවී පැවතුනි.

### 1.2.5 නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

------------------------------------------------------------------------

නීති , රීත, රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය | මල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 2004 ජූලි 29 දිනැති අංක පීඊඩී 25 දරන චක්‍රලේඛය | ආයතනය විසින් තම අරමුදල් ආයෝජනය කිරීමේදී මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු වුවත් 2009 වර්ෂයේදී ආයෝජනය කර තිබූ රු.6,000,000 ක් සහ 2010 වර්ෂයේදී ආයෝජනය කර තිබූ රු.9,200,000 ක් වූ ස්ථාවර තැන්පතු සම්බන්ධයෙන් එකී අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

### 1.2.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තොර ගනුදෙන

------------------------------------------------

2010 අධ්‍යයන වර්ෂයේ ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවේ අයදුම්පත් ගාස්තු ලෙස අයදුම්කරුවෙකුගෙන් රු.500 බැගින් අයදුම්කරුවන් 826 දෙනෙකුගෙන් රු.413,000 ක් අය වී තිබූ අතර එම මුදලින් 1994 ජුනි 14 වැනි දිනැති හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 95 හි විධිවිධාන වලින් බැහැරව විභාග අධීක්ෂණය, උත්තර පත්‍ර පරීක්ෂාව, නිවාඩු දින දීමනා, අතිකාල දීමනා වැනි වියදම් දරා තිබුණි. එසේම එම පාඨමාලා ආදායමෙන් රු.167,800 ක් ශිෂ්‍ය සුභසාධනය සඳහා වූ ව්‍යාපෘතියේ සේවය කළ නිලධාරීන්ටද දීමනා ලෙස ගෙවා තිබුණි. ශ්‍රම අධ්‍යාපනවේදී පාඨමාලාවට එම නිලධාරීන්ගේ අවශ්‍යතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

------------------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයම් කටයුතු වල ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.18,098,126 ක ඌනතාවයක් වු අතර, ඉකුත් වර්ෂය සඳහා ඊට අනුරූප ඌනතාවය රු.12,297,565 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.5,800,561 කින් වැඩි වී තිබුණි. පුනරාවර්තන වියදම් සඳහා රු.19,000,000 ක් වු රජයේ ප්‍රදානය හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.901,874 ක අතිරික්තයක් බවට පත් වී තිබූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු.16,806,000 ක් වු රජයේ ප්‍රදානය හේතුවෙන් එම වර්ෂය සඳහා වූ ඌනතාවය රු.4,508,435 ක අතිරික්තයක් බවට පත් වී තිබුණි. ඉකුත් වර්ෂයට අනුව සමාලෝචිත වර්ෂයේ රු.3,606,561 ක අතිරික්තයේ අඩුවීමක් සඳහා රු.4,482,625 ක ආදායම වැඩිවීමට සාපේක්ෂව රු.8,089,186 ක වියදම වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

#### 2.1.1 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------

1994 ජුනි 14 දින හා අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කළ චක්‍රලේඛයක් පදනම් කරගෙන දෙවන හා තෙවන භාෂා ප්‍රවීනත්වය වෙනුවෙන් වැටුප් හා දිරිදීමනා වශයෙන් 2010 වර්ෂයේ දී රු.78,450 ක් ගෙවා තිබුණි. මෙම දීමනා ගෙවීම රජයේ නීතිරීතීන්ට පටහැණි බවට රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයා හා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට දන්වා තිබුණු නමුත් එම ගෙවීම අඛණ්ඩව සිදු කරමින් පැවතුණි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

--------------------------

#### 2.2.1 කාර්යසාධනය

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනය විසන් පවත්වනු ලබන ප්‍රධාන උපාධි පාඨමාලාව වන ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව සඳහා 2010 වර්ෂයේ ලියාපදිංචි නවක සිසුන් සංඛ්‍යාව 126 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට වඩා සිසුන් 44 කගේ අඩුවීමක් විය.

(ආ) 2010 වර්ෂය තුළ දී මුදල් අය කිරීමේ පාඨමාලා 18 ක් පවත්වා තිබුණ අතර ඒ සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව 9319 කි. විභාගයන්ට පෙනී නොසිටි ශෂ්‍ය සංඛ්‍යාව 576 ක් වූ අතර එය ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 6% ක් විය. අසමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව 576 ක් වූ අතර එය විභාගයන්ට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 6.6% ක් විය. විභාගයන් 06 ක් පවත්වා මාස 04 සිට මාස 10 දක්වා කාලයක් ගත වී තිබුණද ප්‍රතිඵල නිකුත් කර නොතිබුණි.

(ඇ) මුදල් අය කිරීමේ පාඨමාලා ගාස්තු වශයෙන් රු.54,497,829 ක් 2010 වර්ෂය තුළ ලැබී තිබූ අතර එය ඉකුත් වර්ෂය හා සසඳන විට 14% ක වැඩිවීමක් විය.

(ඈ) ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව සඳහා 2010 වර්ෂයේ දී වෙන් කරන ලද පැය ගණන පැය 1107.5 ක් වූ අතර එය සෙමෙස්තර ක්‍රමය අනුව තීරණය විය. ඒ අනුව වෙන් කරන ලද පැය ගණනෙහි පෙර වර්ෂයට වඩා දේශන පැය 417.5 ක වැඩිවීමක් විය. එසේම 2010 වර්ෂය තුලදී පැවැත්වූ තථ්‍ය මුළු දේශන පැය ගණන ද පැය 1107.5 ක් වු අතර එය පෙර වර්ෂය හා සසඳන විට පැය 658.5 ක වැඩිවීමක් විය. පවත්වන ලද දේශන පැය ගණනින් පැය 423 ක් ආයතනයේ අභ්‍යන්තර දේශකයින් පස් දෙනෙකු විසින් ද පැය 724.5 ක් බාහිර දේශකයින් 24 දෙනෙකු විසින් ද පවත්වා තිබුණි. මේ අනුව පෙර වර්ෂය හා සසඳන විට අභ්‍යන්තර දේශකයින් විසින් පවත්වන ලද දේශන පැය 254 ක වැඩිවීමක් සහ බාහිර දේශකයින් විසින් පවත්වන ලද දේශන පැය 444.5 ක වැඩිවීමක්ද විය. මුළු දේශන පැය ගණනින් අභ්‍යන්තර දේශකයින් පවත්වා තිබුණු දේශන පැය ප්‍රමාණය 37% ක් විය.

### 2.2.2 ඌන උපයෝජිත වත්කම්

--------------------------

2007 සැප්තැම්බර් හා 2008 පෙබරවාරි යන මාස වලදී රු.330,155 කට මිලදී ගත් ඇඟිලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍ර තුනෙන් දෙකක් අළුත් වැඩියා කළ නොහැකි තත්වයේ පැවති බැවින් 2008 වර්ෂයේ සිටම භාවිතයට ගෙන නොතිබූණි.

### 2.2.3 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර සැලැස්ම

--------------------------------------------

2003 ජුනි 02 දින දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී 12 හි 5 වන පරිච්ඡේදයේ 5.1.3 ඡේදයට අනුව සංයුක්ත සැලැස්ම වාර්ෂිකව සකස් කළ යුතු වුවද 2009 වර්ෂයේ සිට සංයුක්ත සැලැස්මක් හෝ එම වර්ෂ සඳහා ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එබැවින් ආයතනය විසින් ඒ ඒ වර්ෂයන් තුලදී ළඟා කර ගැනීමට බලාපොරොත්තු වූ අභිමතාර්ථ හා ඉලක්ක මොනවාද යන වග හා එහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය පරීක්ෂා කළ නොහැකි විය.

2.2.4 අයවැය ලේඛනය

------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව සංයුක්ත සැළැස්ම හා ක්‍රියාකාර් සැලැස්ම පිළියෙළ කර එය පදනම් කර වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කළ යුතු වුවද ආයතනය විසින් ඉහත සැළැසුම් වලින් තොරව අයවැය ලේඛනය පිළියෙල කර තිබුණි.

3. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රය කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) විභාග කටයුතු

(ආ) ස්ථාවර වත්කම් ලේඛනගත කිරීම